# පධානඝර නිර්මාණයේ දී ස්වාභාවික පරිසරයේඋපයෝගීතාව පිළිබඳ අධ්‍යයනයක්

(කිරළාගල පධානඝරය ඇසුරින්)

ඊ.එම්.එන්.එදිරිනායක

පුරාවිද්‍යා හා උරුම කළමණාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
nilusha3615@gmail.com

ප්‍රමුඛ පදඃ පධානඝර, කළමණාකරණය, ස්වාභාවික පරිසරය,උපයෝගීතාව

## හැඳින්වීම

බුදු දහම මෙරටට ප්‍රවිෂ්ට වීමත් ,එහි ප්‍රතිඵලයක් ලෙස මෙරට සංඝ සමාජය නිර්මාණය විය. මෙම සංඝ සමාජයට ඇවැසි සංඝාරාමයන් ඉන් පසුව බිහිවන්නට විය. වනවාසී භික්ෂූන් වෙනුවෙන් බිහි වූ ආරාම විශේෂයක් ලෙස පධානඝර හැඳින්විය හැකි ය. මහාවංසය ,සමන්තපසාදිකාව වැනි සාහිත්‍ය මූලාශ්‍රය හා පෙරිමියන්කුලම හා මැදිරිගිරිය ආදි ස්ථාන වලඇති ශිලා ලේඛන මූලාශ්‍ර ,මෙම ආරාම විශේෂය පිළිබඳ තොරතුරු සපයයි. මෙකී මූලාශ්‍රයන්ට අනුව පධානඝර, පියන්ගල් හා පදන යන නම් මෙම ආරාම සඳහා භාවිත කර ඇති ආකාරය හඳුනාගත හැකය. එමෙන්ම මෙම ආරාම විශේෂය පිළිබඳ එච්.සී.පී .බෙල්, හෝකාර්ට් හා සේනක බන්ඩාරනායක වැනි විද්වතුන් පර්යේෂණ කර ඇත. ඒ අනුව මෙම ආරාම අනුරාධපුර යුගයේ මධ්‍ය භාගයේ ආරම්භ වී,පොළොන්නරු යුගය දක්වා පැවති බව දැනට ලැබී ඇති මූලාශ්‍ර ගත කරුණු අනුව හඳුනාගත හැකි ය. කිරළාගල, අනුරාධපුර බටහිරාරාමය, අරන්කැලේ හා රිටිගල ආශ්‍රිතව මෙම ආරාම පැවති බව හඳුනාගත ගෙන තිබේ. වෙනස් පරිසර තත්වයන් වුවද පොදු ආකෘතියකට අනුව නිර්මාණය වුවත් ඇතැම් අවස්ථාවල ස්වාභාවික පරිසරයේ පිහිටීම අනුව එම ආකෘතිය වෙනස් වන ආකාරය හඳුනාගත හැකි ය. මෙකී අධ්‍යනයේ අරමුණ වන්නේ වෙනස් පරිසර තත්වයන් හී මෙම ආරාම නිර්මාණයේ දී අවශ්‍යතාව අනුව ගොඩනැගිලි, ජල කළමණාකරනය හා අනෙකුත් අංග නිර්මාණයේ දී සථානයෙන්,ස්ථානයට වෙනස් වුයේ ස්වාභාවික පරිසරයේ පිහිටීම මත ද යන්න මෙහිදී සංසන්දනාත්මක ලෙස අධ්‍යනය කිරීම සිදුකරයි.එමෙන්ම මෙම ආරාම පොළොන්නරු යුගයෙන් පසු තව දුරටත් විකාශනය නොවීමට හේතු ද, මෙහි දී අධ්‍යනය කරණු ලබයි.

## ක්‍රමවේදය

මෙම අධ්‍යනයේ දත්ත රැස්කිරීමේ දී ක්ෂේත්‍ර නොවන අධ්‍යනය යටතේ පූර්ව පර්යේෂණන් හා සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යනය මඟින් හා අදාළ කේෂත්‍රය නිරික්ෂණය කොට තොරතුරු එක්රැස් කරන ලදි .මේලෙස ලබාගත් දත්ත එකිනෙක තුලනාත්මකව විශ්ලේෂණය කොට,දත්තයන් හමුවන කේෂත්‍රයන් සමඟ සංසන්දනය කරමින් ,දත්ත ඉදිරිපත් කිරීම සිදුකරයි.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

ක්‍රි.ව 05 වැනි හෝ 06 වැනි සියවස්වල ආරම්භ වන්නට ඇතැයි සැලකෙන මෙම පධානඝර ආරාම හුදකළා නැතිනම් ස්වාභාවික ලෙස පිහිටි කැලෑ බද

ප්‍රදේශවලට යාබඳව ඇති ගල් තලාවක් මත හෝ කඳුකර ප්‍රදේශයක් කේන්ද්‍ර කර ගනිමින් නිර්මාණය කර ඇති ආකාරය හඳුනාගත හැකිය. මූලාශ්‍රය ගත කරණු අනුව පැහැදිලි වනුයේ මෙම ආරම බෝහෝවිට භාවිත කර ඇත්තේ වනවාසී භික්ෂූන් වහන්සේලා බවයි. ආරාමය වටා බැම්මක් බැද නැගෙනහිර දිශාවේ හි ප්‍රධාන දොරටුව හා අනෙකුත් දිශා තුනෙහි උප දොරටු පිහිටුවා තිබේ .මෙහි අභ්‍යන්තරයේ ශිලා පාලමක් මඟින් සම්බන්ධ වූ ද්විත්ව වේදිකා ගොඩනැගිලි එමෙන්ම ඒ වටා යන දිය අගලක් ද ,සනිපාරක්ෂාව සඳහා වූ ජන්තාඝරයක් ද, පෙත් මං, පොකුණු, කුඩා දිය අගල් ,චංකමණසර අංග පොදුවේ පධානඝර ආශ්‍රිත දැකගත හැති වේ. නමුත් විශේෂත්වය වනුයේ ,මෙම අංගයන් ස්වාභාවික පිහිටීම මත එම පරිසරයට අනුකූල වන අයුරින් අතීත මිනිසා නිර්මාණය කිරිමේ දි පොදු ආකෘතිය එලෙසින්ම අනුගමනය නොකිරිමයි. පධානඝර ආශ්‍රත පරිසර කළමණාකරනය ප්‍රධාන අංග කිහිපයක් යටතේ අධ්‍යයනය කළ හැකිය. එනම් ,ගොඩනැගිලි හා මං මාවත් ඉදිකිරිම, ජලය සම්පාදනය කර ගැනිම,යන අංග ස්වාභාවික පරිසරයේ පිහිටීම මත වෙනස් වූ ආකාරය පහත පරිදි දැක්විය හැකිය. මෙහි දී ප්‍රධාන වශයෙන් අධ්‍යන කේෂත්‍රය බවට පත්වනුයේ ක්‍රි.ව 05 වැනි සියවසේ දී නිර්මාණය වන්නට ඇතැයි සැලකෙන කිරළාගල පධානඝර සංකීර්ණයයි. ඉහත දැක් වූ අංග බෝහොමයක් මෙහි අන්තර්ගත වන බව හඳුනාගත හැකි ය. මෙහි ගොඩනැගිලි පිළිබඳ විමසිමේ දී විශේෂයෙන් කිරළාගල ආශ්‍රිතව විශාල ලෙස පැතිරුන ගල් තලාවක් කේන්ද්‍ර කර ගෙන නිර්මාණය කර ඇත. මෙම ගල් තලාවෙහි පිහිටීම උපයෝගී කර ගෙන ද්විත්ව හා ත්‍රිත්ව ගොඩනැගිලි නිර්මාණය කර තිබේ. මෙහිදි කළු ගල් පැතිරුන කොටසේහි සම්පූර්ණ ගොඩනැගිලි දෙකත්,ඇතැම් ස්ථානවල පිටුපස වේදිකා කළු ගල් සහිත කොටසෙත් පස සහිත මතුපිට ඉදිරිපස වේදිකාවත් නිර්මාණය කර තිබේ. නමුත් රිටිගල ආශ්‍රිතව මෙම තත්වය වෙනස්වන ආකාරය දැකගත හැකි ය.එනම් රිටිගල පධානඝර ගොඩනැගිලි කිරළාගල පධානඝර ගොඩනැලිවලට වඩා වෙනස් වේ. එනම් කන්දක් අශ්‍රිතව පැතිරුන ගල් තලාවක් මත ඉදිකිරිමත්, ඇතැම් වේදිකා ගල් කණු මත නිර්මාණය විම ද විශේෂ ලක්ෂණයකි. එමෙන්ම මෙම ගල් සහිත පධානඝර අරන්කැළේ ආශ්‍රිතවද දැකගත හැකි ය. සක්කගල්, ගඩොල් හා කැට ගල් වේදිකා නිර්මාණයේ දී භාවිතා කර ඇති අතර මෙම අමුද්‍රව්‍ය භාවිතය ද ස්ථානයේ පිහිටිම මත වෙනස්නවන ආකාරය හඳුනාගත හැකිය.එමෙන්ම පෙත් මං, චංකමණසර ගැන සලකා බැලිමේ දී ,කිරළාගල ආශ්‍රිතව පෙත් මං හා භාවනා කිරීමට හෝ සක්මන් කිරිමට සකස් කළායැයි සැළකෙන චංකමණසරයක් ද, මෙවැනි ගොඩනැගිල්ලක් අරන්කැලේ ආශ්‍රිතවද හදුනාගෙන ඇත .එනමුත් රිටිගල වැනි ස්ථානවල මෙවන් අංගයක් දැකගත නොහැකි ය. මෙම ගොඩනැගිල්ල සෙවන හෝ තද අව් රශ්මිය ඇති අවස්ථාවල භාවනා හෝ සක්මන් කිරිමට භාවිත කරඇති අතර,රිටිගල වැනි කඳු ආශ්‍රිතව ගල් තලාවකට සාපේක්ෂකව සෙවන ,විශේෂයෙන්ම මෙම ප්‍රදේශය ආශ්‍රිත ව ඇති සිසිලස නිසා මෙවැනි ගෘහයක අවශ්‍යතාව ඇති නොවන්නට ඇති බව උපකල්පනය කළ හැකිය.මේලෙස ස්වාභාවික පිහිටීම මත වෙනස් වූ තවත් අංගයක් ලෙස ජල කළමණාකරණය දැක්විය හැකි ය. අවශ්‍යතාව මත ස්වාභාවික පරිසරය උපයෝගි කර ගෙන ජල අවශ්‍යතාව සිදුකරගෙන ඇති ආකාරය හඳුනාගත හැකිය. එනම් කිරළාගල පධානඝරය ආශ්‍රිත ව ගල් තලාව මතුපිට දිය අගල් සුළු ප්‍රමාණයක් දැකගත හැකි අතර මේවා ගල්තලාව මත ඇතිවන උණුසුම සමනය කිරිමට

යොදාගෙන ඇත. විශාල පොකුණක් මඟින් ස්නානය හා පානීය ජල අවශ්‍යතාව සපුරාගෙන ඇත.මේවාට ජලය වර්ෂාවෙන් ජලය ලබාගෙන ඇති අතර, මෙවැනි විශාල පොකුනක් අරන්කැලේ ආශ්‍රිතව ද දැකගත හැකි ය.නමුත් රිටිගල ආශ්‍රිතව බන්දා පොකුණු ලෙස සැලකෙන කුඩා පොකුණු බොහෝමයක් පිහිටා ඇත. මෙහි දී ,ඇතිවන ප්‍රධාන ගැටළුවක් නම් එකම දේශගුණික කලාපයක පිහිටන රිටිගල හා කිරළාගල ගත් විට, ලැබෙන වාර්ෂික වර්ෂාපතනය සමානය. නමුත් රිටිගල වර්ෂයේ සෑම කාලයකදී ම ජලය මූලාශ්‍ර බහුල වීමත්, එයට සාපේක්ෂව කිරළාගල එවැනි තත්වයක් දක්නට නොලැබීමත්ය. මේලෙස වීමට ප්‍රධාන හේතුව ස්වාභාවිකව රිටිගල වියළි කළාපය පිහිටා තිබුණ ද සිසිල් දේශගුණයක් හා කඳුකර ආශ්‍රිත කලාපයක් නිසා උල්පත් ජලය මත ජල මූලාශ්‍ර බහුල වීමත්, ආරමයන් නිර්මාණයේ දී මෙම කරුණු සැළකිල්ලට ගෙන භූමිය තුළ ජලය කළමණාකරනය සඳහා බලපාන්නට ඇති බව උපකල්පනය කළ හැකි ය. මෙලෙස ස්වාභාවික පරිසරයේ පිහිටීම උපයෝගී කරගනිමින් මෙම ආරමයන් වෙනස්වන ආකාරය හඳුනාගත හැකිය. එ මෙන්ම මෙම ආරාමයන් පිළිබඳ පොළොන්නරු යුගයෙන් පසු අසන්නට නොලැබෙන අතර මෙයට හේතුව ලෙස පෙළොන්නරු යුගයේ අවසානයත් සමඟ විවිධ ආක්‍රමණ ,රාජ්‍ය අනුග්‍රහය නොලැබීම හා ආගමික වශයෙන් ඇති වූ වෙනස්කම් මේ සඳහා බලපාන්නට ඇති බව උපකල්පනය කළ හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


අතුකොරාළ, යුරේන්. (2016)පධානසර වල වාස්තුවිද්‍යා **ලක්ෂණ.ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංහිතා වේළුම 6.** පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

ගුණවර්ධන, ප්‍රිශාන්ත. (2011) ***ශ්‍රී ලංකාවේ පැරණි බෞද්ධ සංඝාරාම.***ජා ඇලඃ සමන්ති පොත් ප්‍රකාශකයෝ.

අලහාකොන්,උදිත. (2011)*රිටිගල*.මධ්‍යම සංස්කෘතික අරමුදල.

Wijesuriya, G.S. (1998)***Buddhist Meditation Monasteries of Ancient Sri Lanka***. Dept. of Archaeology.